පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය- 79

ආයතනයේ නම - ඉඩම් අමාත්‍යාංශය, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව, මිනින්දෝරු දෙපාර්තමේන්තුව, ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற அமர்வு இலக்கம் -79

நிறுவனத்தின் பெயர் -

காணி அமைச்சு, காணி ஆனையாளர் தினைக்களம், நில அளவைத் தினைக்களம், காணி உரித்து நிர்ணயத் தினைக்களம், காணி உபயோகத் திட்டமிடல் தினைக்களம்.

பொதுக் கணக்குகளுக்கான பாராளுமன்றத்தின் குழுவினால் பாராளுமன்றத்தில் சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள் தொடர்பில் நிலையியற் கட்டளை இல.119 (4) இன் கீழ் நிறுவனத்துக்குப் பொறுப்பு வகிக்கும் கௌரவ அமைச்சரினால் மேற்கொள்ளப்பட்ட அவதானங்கள் மற்றும் நடவடிக்கைகள் ஆகியவற்றைச் சமர்ப்பித்தல்.

Parliament Session No.-79

Name of the institution – Ministry of Lands, Land commissioner General's Department, Servey Department of Sri Lanka, Land Title Settlement Department, Department of Land Use Policy Planning

Submission of the observations and steps Taken by the Hon. Minister in charge of the institute under the standing order No'119(4) related to the reports tabled into the parliament by the committee of Public Accounts (COPA) to the parliament.

ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව රජයේ ගිණුම් කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාව සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගන්නා ලද ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීම.

පාර්ලිමේන්තු සැසි අංක -79

ආයතනයේ නම - ඉඩම් අමාත්‍යාංශය

කමිටුව විසින් හඳුනා ගන්නා ලද දුර්වලතා අඩුපාඩු	නිවැරදි කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග/ වර්තමාන තත්ත්වය
පළමු කොටස 90.00	
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි. අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ නොසැපයූ අවස්ථා වාර්තා විය. වර්ෂයකට වඩා වැඩි කාලයක් සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	මෙම තත්ත්වය වලක්වා ගැනීමට කටයුතු කර ඇති අතර නිසි පරිදි විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම සිදුවේ. පැවති ණය ශේෂ දැනට නිරවුල් කර ඇති අතර වෛද්‍ය හේතුන් මත සේවයෙන් විශ්‍රාම ගැන්වූ නිලධාරියකුගේ විශ්‍රාම වැටුප සකස් වන්නේ 2029 වර්ෂයේ දී බැවින් එම ණය ශේෂය පමණක් ඉතිරිවී ඇත.
දෙවැනි කොටස 90.00	
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2022 වර්ෂය සඳහා පුහුණු සැලැස්මක් සකස් කලද, 2022 වර්ෂයේදී පැවති කොවිඩ් 19 වෛරස් ව්‍යාප්තිය හේතුවෙන් සංචරණ සීමා පනවා තිබීම මත සැලසුම් කරන ලද පුහුණු වැඩසටහන් සියල්ලම එම වර්ෂය තුල පැවතීමට නොහැකි විය. තවද එම වර්ෂයේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් වියදම් සීමා කිරීමට සිදු වූ බැවින් අපේක්ෂිත සැලසුම පරිදි පුහුණු අවස්ථා සඳහා නිලධාරීන් යොමු කිරීමට නොහැකි විය. නමුත් මේ වන විට ජාතික අයවැය චක්‍රලේඛ 01/2024 හි විධිවිධාන කෙරෙහිද අවධානය යොමු කරමින් වාර්ෂිකව සකස් කරනු ලබන පුහුණු සැලැස්ම අනුව සහ අනුමත ප්‍රතිපාදන මත ඉඩම් අංශයෙහි සියලු සේවාවන් ආවරණය වන පරිදි නිලධාරීන් පුහුණු අවස්ථාවන් සඳහා යොමු කරනු ලබයි.

ස්ථාවර නියෝග අංක **119(4)** ප්‍රකාරව රජයේ ගිණුම් කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාව සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගන්නා ලද ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීම.

පාර්ලිමේන්තු සැසි අංක- 79

ආයතනයේ නම - ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

අනු අංකය	කමිටුව විසින් හඳුනා ගන්නා ලද දුර්වලතා අඩුපාඩු	නිවැරදි කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ගවල වර්තමාන තත්ත්වය
1	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර ඇති විගණන විමසුමක් සඳහා මසක් තුළ පිළිතුරු සපයා නොතිබීම..	ඇතැම් විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමට අවශ්‍ය තොරතුරු අන්තර් පළාත් කාර්යාල හා වෙනත් ආයතන වලින් ලබාගත යුතු වන අවස්ථාවන්හිදී ඒ සඳහා අතිරේක කාලයක් වැය වන හෙයින් ඊට පිළිතුරු සැපයීම මාසයක කාලය ඉක්මවන අවස්ථා ඇත. එවැනි අවස්ථාවලදී එම විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමට අතිරේක කාලයක් ඉල්ලා විගණකාධිපති වෙත ලිඛිත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. විගණකාධිපතිගේ විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම කඩිනම් කිරීම සඳහා අදාළ අංශ හා නිලධාරීන් දැනුවත් කිරීමටද කටයුතු කර ඇත. (ඇමුණුම 01)
2	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු සපයා නොතිබීම.	විගණන විමසුම් සඳහා පිළිතුරු නියමිත කාල සීමාව තුල ඉදිරිපත් කරන ලෙස දෙපාර්තමේන්තුවේ සියළුම අංශ දැනුවත් කර ඇත.
3	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මක කර නොතිබීම.	ඌනතා පිළිබඳ මු.රෙ. 104(1) වාර්තාව හා මු.රෙ. 109 නියෝග ලබාගෙන ඇති අතර, හානි කපා හැරීම් සඳහා ප්‍රතිපාදන ලබාගැනීමට කටයුතු කරමින් පවතී. අතිරික්තතා සම්බන්ධයෙන් නිර්දේශ ක්‍රියාත්මක කර ඇත.
4	වාහනයක් ගර්හිත වී මාස 08 වඩා අඩු කාලයක දී අපහරණය කර නොතිබීම.	මේ වන විට මෙම වාහන අපහරණය කර ඇත.
5	රාජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබීම	වාහන අනතුරු සම්බන්ධයෙන් මු. රෙ. ප්‍රකාරව කටයුතු අවසන් කර ඇත.
6	මු.රෙ. 94(1) ප්‍රකාරව වැය විෂයයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම්වලට එළඹ තිබීම .	එම තත්ත්වයන් නිවැරදි කර ඇත.වර්තමානයේ ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම් වලට එළඹ නැත.
7	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතීම.	**විශ්‍රාම ගිය -** ජී.ජී. මාටින් රු.19,940/- කපා හැර ඇත. ආර්.ඒ.ගොඩකන්ද රු.72,983/- පාරිතෝෂිතයෙන් අයකර ඇත. **වැඩ තහනම්** යූ.ඩබ්.තේන්නකෝන් රු.16,495/- ගෙවා අවසන් ඩී. පුෂ්පකුමාර රු. 177,080.44 වාරික වශයෙන් අයකරමින් පවතී. ඒ.ඒ. මුණසිංහ රු. 35,424.00 අයකර අවසන් ඒ.ජී. ලියනගේ රු. 116,800 න් රු.79,650ක ශේෂයක් අයකර ගැනීමට ඇත.
8	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ571 ප්‍රකාරව කටයුතු කර නොතිබීම.	මේ වන විට කල්ඉකුත් වූ තැන්පතු කිසිවක් නොමැත.
9	මු.රෙ371 ප්‍රකාරව නිකුත් කළ තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබීම.	අදාල නිලධාරීන් දැනුවත් කර එම තත්ත්වය මඟ හරවා ගැනීමට ලිඛිතව දැනුවත් කර ඇත.
10	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබීම.	අනුමත සීමාව තුල පමණක් කාර්ය මණ්ඩල බඳවාගෙන ඇත.

11	2018.01.24 දිනැති අංක 05/2018(1) දරන චක්‍ර ලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 08/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙළ කර නොතිබීම.	මේ වන විට පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සකස් කර ඇති අතර, 2026.01.01 දින සිට ප්‍රදර්ශනය කිරීමට පියවර ගෙන ඇත.
12	ආයතනයේ පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබීම.	මේ වන විට පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සකස් කර ඇති අතර, 2026.01.01 දින සිට ප්‍රදර්ශනය කිරීමට පියවර ගෙන ඇත.
13	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබීම.	2023 වන විට සකස් කර ඇත.
14	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබීම.	වියදම් පාලනය සම්බන්ධයෙන් වන චක්‍රලේඛ අනුව පුහුණු අවස්ථා පැවැත්වීමට අවශ්‍ය ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් තිබූ අවකාශය සීමා වීම නිසාවෙන් සීමිත පුහුණු වැඩසටහන් ප්‍රමාණයක් පවත්වා ඇත. 2026 වර්ෂයේ සිට කාර්ය මණ්ඩලයෙන් 50% වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කිරීම සඳහා මානව සම්පත් සැලැස්ම සකස් කිරීමට පියවර ගෙන ඇත.
15	සමස්ථ කාර්ය මණ්ඩලයට අතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබීම.	ගිවිසුම්ගතව ඇත.
16	මානව සම්පත් සංවර්ධනය සැලැසුම් සකස් කිරීමට ද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබීම.	එස්.ඒ.එන්.එම්. සිරිවර්ධන - ඉඩම් කොමසාරිස් (පාලන)
17	සැලසුම් පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	කාර්ය මණ්ඩල පුහුණු ධාරිතා සංවර්ධනය සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොතිබුණු නිසාවෙන් සීමිත පුහුණු වැඩසටහන් ප්‍රමාණයක් පවත්වා ඇත. මෙම වර්ෂයේ සිට කාර්ය මණ්ඩලයෙන් 50% කට වැඩි පිරිසකට පුහුණු අවස්ථාවන් ලබාදීමට කටයුතු කර ඇත.
18	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාචන මට්ටමේ/ අහිතකර මට්ටමේ.	යටත්ව මතය

ඇමුණුම 01

මගේ අංකය : LCGD/ACC/2/1/5/8/2025 – Vol. II

ගිණුම් අංශය

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

2025.10. 16

අතිරේක ඉඩම් කොමසාරිස් ජනරාල්

ඉඩම් කොමසාරිස් (පාලන) / (බඳු) / ප්‍රතිපත්ති හා විමර්ශන / පර්යේෂණ හා සංවර්ධන

අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්/ අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස්

ගණකාධිකාරී (ගිණුම් අංශය)

විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම කඩිනම් කිරීම

ජාතික විගණන කාර්යාලය විසින් නිකුත් කරන විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සම්බන්ධව පහත තත්ත්වයන් නිරීක්ෂණය කරමි.

අ. දින 07ක් තුළ පිළිතුරු කැඳවා නිකුත් කරන විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමට දින 30-60 දක්වා අතිරේක කාලයක් ඉල්ලා විගණකාධිපති වෙත ඉල්ලීම් ඉදිරිපත් කර තිබීම.

ආ. ඇතැම් විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමට දින 60කටත් අධික කාලයක් ප්‍රමාද වී තිබීම.

ඇ. විගණන විමසුම් සඳහා ඉදිරිපත් කරන පිළිතුරුවල සංක්ෂිප්ත බව හා නිශ්චිතභාවය පිළිබඳ අඩුපාඩු

02. මෙම නිරීක්ෂිත අඩුපාඩු අවම කර ගැනීමේ අරමුණින් පහත උපදෙස් නිකුත් කරමි.

අ. විගණන විමසුමක් දෙපාර්තමේන්තුවට ලැබුණු දිනයේ සිට එහි සඳහන් කාලසීමාව ඉක්මවීමට පෙර පිළිතුරු සැපයීමට හැකිවන පරිදි කෙටුම්පත් පිළිතුරු ගිණුම් අංශයට ලබා දීමට අදාළ මාණ්ඩලික නිලධාරියා කටයුතු කළ යුතු වේ.

ආ. විගණන විමසුමේ සඳහන් කාලසීමාව තුළ පිළිතුරු යැවීම ප්‍රායෝගික නොවන අවස්ථාවන්හි දී ඒ පිළිබඳව මා දැනුම්වත් කර පිළිතුරු යැවීම සඳහා අවශ්‍ය අවම කාලසීමාවක් තක්සේරු කර විගණකාධිපති වෙත කල් ඉල්ලීමක් ලිඛිතව යොමු කිරීමට කටයුතු කළ හැකි අතර, එසේ ඉල්ලන ලද කාලසීමාව ඉක්මවීමට පෙර අනිවාර්යයෙන් පිළිතුරු යැවීමට හැකි වන සේ කටයුතු අධීක්ෂණය කිරීමේ වගකීම අදාළ මාණ්ඩලික නිලධාරියා වෙත පැවරේ.

ඇ. විගණන විමසුමෙන් මතු කර ඇති සියළු කරුණුවලට පිළිතුරු සැපයෙන සේ සංක්ෂිප්ත හා සම්පූර්ණ පිළිතුරක් කෙටුම්පත් කර ගිණුම් අංශයට ඉදිරිපත් කිරීමට අදාළ මාණ්ඩලික නිලධාරීන් විශේෂයෙන් සැලකිලිමත් විය යුතු වේ.

ඈ. විගණන විමසුම් සඳහා නියමිත දිනට පිළිතුරු යැවීමට අපොහොසත් වීම ඉතා බරපතල කරුණක් සේ සළකා කටයුතු කළයුතු බව තවදුරටත් අවධාරණය කරමි.

චන්දන රණවීර ආරච්චි

ඉඩම් කොමසාරිස් ජනරාල්

ස්ථාවර නියෝග අංක 119 (4) ප්‍රකාරව රජයේ ගිණුම් කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාව සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගන්නා ලද ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීම.
පාර්ලිමේන්තු සැසි අංකය - 79
ආයතනයේ නම - මිනින්දෝරු දෙපාර්තමේන්තුව

කමිටුව විසින් හඳුනා ගන්නා ලද දුර්වලතා අඩුපාඩු	නිවැරදි කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග /වර්තමාන තත්ත්වය
පළමු කොටස : 88.00	
01.2024.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ මුරපද තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි.	මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේGPS -PAYROLL මෘදුකාංගයේ මුරපදය මාස 03 කට වරක් වෙනස් කිරීමට කටයුතු කර ඇත.
02. විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුල පිළිතුරු සපයා නොතිබුණි.	සෑම විගණන විමසුමකටම පිළිතුරු සැපයීම එසේ ප්‍රමාද වී නොමැති නමුත් ප්‍රාදේශීය කාර්යාල විගණනයේදී අතිරේක සර්වේයර් ජනරාල් (ක්ෂේත්‍ර) මගින් පළාත් සර්වේයර් ජනරාල් මගින් දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී මගින් ප්‍රාදේශිය කාර්යාල වලින් පිළිතුරු ගෙන්වා ගැනීමේදී යම් ප්‍රමාදයන් ඇතිවේ.
03. අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා වේ.	සෑම අභ්‍යන්තර විගණන විමසුමකටම පිළිතුරු සැපයීමට මාසයකට වඩා වැඩි කාලයක් ගෙන නැතිඅතර, ඇතැම් විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමට ප්‍රාදේශීය කාර්යාලවලින් තොරතුරු ගෙන්වා ගැනීමට සිදුවන බැවින්, ඒ සඳහා යම් ප්‍රමාදයක් සිදු වී ඇත.
04. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශ ද නියමිත කාල වකවානු තුල ක්‍රියාත්මක කර නොතිබුණි.	දෙපාර්තමේන්තුවට අයත් කාර්යාල 189, රජයේ මිනින්දෝරු 545 ක් සංචාරක බංගලා 10 ක් හා මැනුම් හා සිතියම් ගතකිරීමේ ආයතන 03 ක් (මුළු ලෙජර් 747ක්) පවතින බැවින් හා එම කාර්යාල හා නිලධාරීන්ට ලබාදී ඇති මෙම දෙපාර්තමේන්තුවටම විශේෂිත වූ භාණ්ඩ (උපකරණ රාශියක්ද සහිත) විශාල සංඛ්‍යාවක් ඇති බැවින්, එවා සියල්ල පරීක්ෂා කර ලිපි සකස් කිරීමට වැඩි කාලයක් ගතවීම නිසා නිෂ්කාශණ ලබාදීමට ප්‍රමාද වුවත් මේ වනවිට සියලුම කාර්යාල හා

05.වාහනයක් ගර්භිත වී මාස 8 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	දෙපාර්තමේන්තුවෙහි ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල ඇතුලුව දිවයින පුරා ව්‍යාප්තව පවතින ආයතනයන්හි වාහන අපහරණ කටයුතු සම්බන්ධීකරණය ප්‍රධාන කාර්යාලය මගින් සිදු කරන අතර, එම කමිටු සඳහා වෙනත් ආයතන මගින් ද නිලධාරීන් සම්බන්ධ කර ගත යුතු වේ. එහි දී තක්සේරු මණ්ඩල පත් කිරීම, අමාත්‍යාංශ අනුමැතිය ලබා ගැනීම, වාහන ලියාපදිංචිය අවලංගු කිරීම හා ලංසු කැඳවීම යන ක්‍රියාවලිය පියවර කිහිපයක් යටතේ සිදුකලයුතු බැවින් යම් ප්‍රමාදයක් පැවතියද, පළාත් සර්වේයර් ජනරාල් කමිටු රැස්වීම් හා සිහි කැඳවීම් මගින්ද සහභාගී නොවන වෙනත් ආයතන සාමාජිකයන් වෙනුවට කමිටුවට නව සාමාජිකයන් නොපමාව පත්කරමින් ද මෙම කාර්යය කඩිනම් කර ගැනීමට කටයුතු කරමින් පවතී. ඒ අනුව, නියමිත කාර්යය දර්ශක ඉලක්ක ලගා කර ගැනීමට ඉදිරි පියවර ගෙන ඇත.
06. වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	2022 වර්ෂයේ පැවති ණය ශේෂයෙන් රු.2,215,713.48 ක මුදලක් නිරවුල් වී ඇත. දැනට අයවෙමින් පවතින හිඟ ණය ශේෂය රු. 780,527.97 කි. රු. 1,363,726.25 ක හිඟ ණය ශේෂයක් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. කපා හැරීමට කටයුතු කරමින් පවතින හිඟ ණය ශේෂය රු. 502,126.00 කි.
දෙවැනි කොටස : 97.00	
07.සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2022 වර්ෂයේ පුහුණුවීම් සඳහා ලද ප්‍රතිපාදන ප්‍රමාණය රු.8,378,292.02 වන අතර ඉන් රු.2,962,437.08 ප්‍රතිපාදන ප්‍රමාණයක් ඉතුරුව පවතී. පුහුණුවීම් සඳහා ප්‍රතිපාදන වැය කර ඇති ප්‍රතිශතය 65% කි.

ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව රජයේ ගිණුම් කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාව හා සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගන්නා ලද ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීම.

පාර්ලිමේන්තු සැසි අංක - 79

ආයතනයේ නම - ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

කමිටුව විසින් හඳුනා ගන්නා ලද දුර්වලතා/ අඩුපාඩු	නිවැරදි කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග/ වර්තමාන තත්ත්වය
විගණකාධිපති විගණන විමසුම් හා අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු සපයා නොතිබීම.	දෙපාර්තමේන්තුවට අයත් ප්‍රාදේශීය කාර්යාල වෙතින් අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට සිදුවන බැවින් විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු සැපයීමට නොහැකිවන අවස්ථා ඇතත් හැකි සෑම විටම මසක් ඇතුළත පිළිතුරු සැපයීමට කටයුතු කරනු ලැබේ.
2017.06.26 දිනැති අංක 1/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 13 ඡේදය ප්‍රකාරව චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු නිලධාරියෙකු පත්කර කොම්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත දන්වා නොතිබීම.	2024 වර්ෂයේදී නිලධාරියෙකු නම් කර කොම්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත දන්වා යවා ඇත.
සියලූ වාහනවල අයිතිය තහවුරුකරන ලිපි සන්තකයේ නොමැතිවීම.	දෙපාර්තමේන්තුව සතු වාහන 40 න් 39 ක අයිතිය දෙපාර්තමේන්තුව සතුව ඇත. අනෙක් වාහනය ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය සතු වාහනයකි. එම වාහනය මෙම දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීම සඳහා අදාල ලේඛන මේ වන විට භාරදී ඇත.
වාහනයක් ගර්හිතවී මාස 8 ට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබීම.	2024.10.11 දින අපහරණය සිදු කර ඇත.
සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබීම.	මේ වන විට දෙපාර්තමේන්තුව සතු සියලුම වාහන වල ලොග් සටහන් පොත් යාවත්කාලීන කර ඇත.
මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම්වලට එළඹ තිබීම.	2024 වර්ෂයේ සිට ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම්වලට එළඹ නොමැති අතර ඉදිරියේදී ඒ පිළිබඳව සැලකිලිමත් වීමට සටහන් කර ඇත.

වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතීම.	හිඟ ණය ශේෂ පවතින විශ්‍රාම ගොස් ඇති නිලධාරීන්ගේ හිඟ ණය ශේෂ විශ්‍රාම පාරිතෝශකය මඟින් අය කිරීමට කටයුතු කරන අතර වැඩ තහනම්කළ නිලධාරීන් දෙදෙනෙකු රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මඟින් මේ වන විට නැවත සේවයේ පිහිටුවා ඇති අතර සේවයට වාර්තා කළ පසු හිඟ ණය ශේෂ අය කිරීමට කටයුතු කරනු ලැබේ. වැඩ තහනම් කළ තවත් නිලධාරියෙකුගේ විනය කටයුතු අවසන් වී නොමැති අතර සේවය හැර ගිය නිලධාරියෙකුද නැවත සේවයේ පිහිටුවීමට නිර්දේශ ලබාදී ඇත.
මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිමවී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබීම.	ප්‍රාදේශීය කාර්යාල සඳහා ලබාදී ඇති තත්කාර්ය අතුරු අග්‍රිම පියවා ගැනීමේදී සමහර අවස්ථාවලදී මාසය ඉක්මවා යන අවස්ථා ඇත. එහෙත් යම් ඉතිරි මුදලක් වේනම් කාර්ය නිමවූ වහාම ඒවා දෙපාර්තමේන්තු බැංකු ගිණුමට බැර කරනු ලැබේ. එහෙත් හැකි සෑම අවස්ථාවකදීම මසක් ඇතුළත පියවා ගැනීමට කටයුතු කරනු ලැබේ.
ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත්වන පැමිණිලි ලේඛනගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලේඛන පවත්වා නොතිබීම.	මේ වන විට නිසිපරිදි ලේඛනයක් පවත්වාගෙන යනු ලබයි.
2018.01.24 දිනැති අංක 05/2008(1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙළ කර ක්‍රියාත්මක කර නොතිබීම. ආයතනයේ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකසකර නොතිබීම.	දෙපාර්තමේන්තුවේ සියලු ප්‍රාදේශීය කාර්යාල සඳහා පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි සකස් කර සියලුම කාර්යාලවල මහජනයාට ප්‍රදර්ශනය වන පරිදි ස්ථාපිත කර ඇත. එසේම ප්‍රාදේශීය කාර්යාලවල නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරු සහ ප්‍රධාන කාර්යාලයේ සහකාර කොමසාරිස්වරු විසින් එය ක්‍රියාත්මකවීම පිළිබඳ අධීක්ෂණ කටයුතු සිදු කරනු ලබයි.
2018 ජනවාර් 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස්කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබීම. සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්යමණ්ඩලයෙන් සියයට 50කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබීම.	මේ වන විට මානව සම්පත් සැලැස්ම සකස් කර ඇති අතර පුහුණු සැලැස්ම අනුව පුහුණුව ලැබිය යුතු නිලධාරීන් සඳහා පුහුණු වැඩ සටහන් ලබා දී ඇත .
සමස්ථ කාර්යමණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස්කර ගිවිසුම් ගතව නොතිබීම.	2023.11.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2/2018(i) ප්‍රකාරව කාර්ය සාධන ගිවිසුම සකස් කිරීම අහෝසිකර ඇත.

මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම්කර නොතිබීම.	ඊට අදාලව දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දන්වා යවා ඇත.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබාදී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතීම.	මේ වන විට ව්‍යවස්ථාපිත පුහුණු සහ ධාරිතා සංවර්ධන පුහුණු අවස්ථා ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් හා ප්‍රධාන කාර්යාල ලෙස තෝරා ගනිමින් සියළුම තරාතිරම්වල කාර්ය මණ්ඩල සඳහා පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ.
සියලු නිලධාරින් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබීම.	මේ වන විට සියලුම මාණ්ඩලික නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ නියමිත දිනට ලබා දී ඇත.

ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව රජයේ ගිණුම් කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාව සම්බන්ධයෙන් නිරීක්ෂණ භාගන්නා ලද ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු සැසි අංක - 79

ආයතනයේ නම - ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව - 2022

අනුඅංකය	කමිටුව විසින් හඳුනා ගන්නා ලද දුර්වලතා/ අඩුපාඩු	නිවැරදි කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය
01	සියලු වාහන වල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත. සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි.	දෙපාර්තමේන්තුව සතු සියලුම වාහන මේ වනවිට අධ්‍යක්ෂ ජනරාල් නමින් ලියාපදිංචිකර ඇති අතර, සෑම වාහනයකම ලොග් පොත් නිසි පරිදි යාවත්කාලීන කර ඇත.
02	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණයන් 50% වඩා අඩු මට්ටමක පැවතුණි.	මේ වන විට වර්ෂයේ සැලසුම් ගත පුහුණු අවස්ථා ලබාදීමේ ප්‍රමාණයන් 100% ආවරණය වන පරිදි සිදු කර ඇත.

කේ.ඩී. ලාල් කාන්ත (පා.ම.)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍ය